# රාජකීය අනුග්‍රහය ලැබූ සිංහළ අළුත් අවුරුද්ද

සිංහළ ජාතික අළුත් අවුරුදු උත්සවයට ආදි කාලයේ රාජ අනුග්‍රහය ලැබී රජවාසළ මුල්වී සියළු කටයුතු සිදු කරන ලද බව පැරණී ලිපි ලේඛනයන්හි සඳහන් වේ. ඒ සිරිත් විරිත් ඉටුකිරීම එවක රාජ නියෝග වශයෙන් සැලකිණ. එම නියෝග කඩකළහොත් රජතුමා ප්‍රකෝපවන බව ද, කඩ කරන්නන්ට දඬුවම් කෙරෙන බව ද දන්වා හැර තිබුණි. හිසතෙල් නානු පිළියෙල කිරීම සහ නැකැත් වේලාවල් නියම කිරීම ආදිය රාජකීය වෛද්‍යවරුන් ද, රජතුමාගේ කාර්‍යයන්හි යෙදෙන නැකැත්කරුවන් ද අතින් ඉටුවිය.

එදවස පැවති අළුත් අවුරුදු උත්සවයක් සියැසින් දැක ඇති ඉංග්‍රීසි ජාතික වෛද්‍යවරයෙකු වූ ජෝන් ඩේවි සිය සංචාරක වාර්තාවක මෙසේ සඳහන් කර තිබේ.

“ රාජ නැකැත්කරුවෝ අවුරුද්ද ලබන මොහොත, ඔසු දිය හිස ගැල්විය යුතු හෝරාව, ආහාර අනුභවය, වැඩ ඇල්ලීම, නව සඳ බැලීම හා ස්නානය කිරීම ආදියට හෝරා පත්‍රය සකස්කර දෙති. උත්සව දිනය ළංවන විට වෛද්‍යයෝ නාථ දේවාලයේදී ඖෂධ පැළෑටි යුෂ භාජන පිළියෙල කර අනෙකුත් දේවාල වලට ද බෙදා දෙති.”

“ නොනගතය ලබන වෙලාව සාණ්ඩා නාදයෙන් ප්‍රකාශයට පත්කරවති. ගමින් ගම, පන්සලෙන් පන්සලට ඒ හඬ විකාශනය කරවති. රජතුමා තම මෙහෙසියන් ද සමග නොනගතය වෙලාවේ දළදා සමිඳු වැඳ පුදාගන්නට යති. ආහාර අනුභවය වෙලාවේදී රජතුමා නැකතට නියමිතව ඇති දිසාවට මුහුණ ලා භෝජනය රස බලා නිළමෙවරුන්ටද දෙති. තෑගි බෝග මෙන්ම වරප්‍රසාද ද දෙති. එසේම ස්නා- නය කරන නැකතේ දී ඉඹුල් කොළ මත පා තබා වැඩහිඳින රජුගේ හිස හා ගත නුග කොළ මත පහන් තබාගත් භද්‍ර යෞවනියන් නාථ දේවාලයෙන් රැගෙන ආ ඔසු පැනින් හා කහ දියරින් රජුනට ආ වඩමින්, රජතුමාණෙනි, දේවයන්වහන්ස, ඔබවහන්සේ පන්දහස් අවුරුද්දක් ඉර හඳ පවතින තුරු, පොළව දිව්‍යලෝක පවතින තුරු ආයු වළඳමින් යෙහෙන් වැජඹෙත්වා! යි නැහැවූහ. ”

රජතුමා ලබන ලද තෑගිවල වටිනාකම නිලධාරීන් විසින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ගාස්තු වලින් අඩු කළ බවත් සෑම නිලධාරියෙකුම ජාතික අවුරුද්ද වෙනුවෙන් රාජකාරි නිවාඩු ලැබූ බවද පැරණී පොත පතේ සඳහන් වේ.

අළුත් අවුරුදු නැකැත් සෑදීම මෙන්ම එදවස පැවති ජනජීවිතයේ ප්‍රධාන සාධකයක් බවට පත්ව තිබූ ජ්‍යොතිශ්‍යයද නායක්කර් වංශික රජවරුන් ලංකා රාජ්‍යයට පත්කරගැන්මෙන් පසුව අප රටේ ප්‍රචලිත වූ බවට සාධක ඇත. ක්‍රිස්තු වර්ෂ 87 දී බටහිර ඉන්දියාවේ රජකමට පත් ශාලිවාහන ශක රජුගෙන් ජෝතිර් විද්‍යාවේ ආරම්භය සිදුවූ බව පිළිගැණේ. නැකැත් ගණන් බලන ශක වර්ෂය ආරම්භ වූයේ එතැනිනි. දකුණු ඉන්දීය දේශය සමග අප රට තිබූ සම්බන්ධතාව මත නැකැත් ශාස්ත්‍රය ශ්‍රීලංකාවට ද කාර්‍යයන් ආරම්භ කිරීම සඳහා පුරුදුවන්නට ඇති බව සිතාගත හැකි ය.

මෙසේ අවුරුදු දහස් ගණනක් ඉපැරණී සූර්ය වන්දනාව අප රටේ සිංහළ අළුත් අවුරුද්ද වශයෙන් සිංහළ ජනයා විසින් ජාතික උත්සවයක් වශයෙන් පිළිගත් දා සිට එය අපේ සංස්කෘතියේ කොටසක් බවට ද මේ දක්වා පත්ව ඇත. ගෙවල් දොරවල් අළුතින් ගොම මැටි ගා පිරිසිදු කිරීම, අළුත් වළං ආදිය යොදා කෑම පිසීම, අළුත් වස්ත්‍රාභරණයෙන් සැරසීම, අළුතින් කර්මාන්ත කටයුතු වල යෙදීම,



පැරණී නෑ සබඳතා අළුත් කරගනිමින් පවුලේ අය එකමුතු වීම ආදිය සිංහල අවුරුද්දේ ඇති විශේෂත්වයයි. එය පුරාණයේ සිටම නොකඩවා පැවත එන්නකි. එසේම එය සෑම සිංහළයෙකුගේම වටිනා සංස්කෘතික පුරුද්දකි. හැදියාවකි. එය චිරාත් කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යන්නට දිරිගනිමු. අපේ ඉදිරි පරම්- පරාවලට ද ඒ මග පෙන්වා දෙමු.

ඔබ සැමට සුබ සිංහළ අළුත් අවුරුද්දක් වේවා !

♦ ***කරුණා බස්නායක*** **London NW 3**

# සිංහළ ජාතිය රැකගැනීමට නම් සිංහළ අවුරුද්ද රැකගත යුතුයි

## - අරිසෙන් අහුබුදු

සිංහළ බස හා සිංහළ සංස්කෘතිය පිළිබඳ විශේෂ දැනුමැති, අද දවසේ ශ්‍රීලංකාවේ වෙසෙන බහුශ්‍රැත වියතෙකු වන කලාශූරී අරිසෙන් අහුබුදු මහතාණන් විසින් සිංහළ අවුරුද්ද ගැන දිවයින පුවත්පතට 2006 වසරේ ලියන ලද ලිපියක මෙසේ සඳහන් වීය.

“ සිංහළ අළුත් අවුරුද්ද යෙදෙන දිනය සිංහළ අපට ඉතා වැදගත්. ජාතියක් සතු සිරිත් විරිත් විනාශවීම එම ජාතියේ විනාශයට හේතුවන බව ප්ලේටෝ දාර්ශනිකයා ප්‍රකාශකර තිබෙනවා. විවිධ අභියෝගයන්ට ලක්වූවත් අප අපගේ සිරිත් විරිත් රැකගැනීමට කටයුතු කළ යුතුයි.

සිංහළ අවුරුදු දිනය රජයේ නිවාඩු දිනයක් කරන ලෙස සිංහළයින් බ්‍රිතාන්‍ය පාලකයන්ගෙන් ඉල්ලා සිටියා. එම ඉල්ලීම ඉටුකිරීමේදී රාමනාදන්ලාගේ සිත සැනසීම සඳහා සිංහළ අවුරුද්ද සිංහළ හා හින්දු අළුත් අවුරුද්ද ලෙස හැඳින්වූවා. පසුව ජේ.ආර්. ජයවර්ධන මහතා සිංහළ අවුරුද්ද, සිංහළ-දෙමළ අවුරුද්ද කළා. මේක දෙමළ අවුරුද්ද නොවෙයි. දෙමළ ජනතාවට ඒ අයගේ වෙනම අවුරුද්දක් තිබෙනවා.

සිංහළ අවුරුද්දේ විනාශය සිංහළ ජාතියේ විනාශය බව ඉතා පැහැදිලියි. එම නිසා සිංහළ ජාතිය රැකගැනීමට නම් සිංහළ අවුරුද්ද රැකගත යුතු වෙනවා.”

Duke's Court Travel

Return Fares to Colombo

SriLankan From £465+
Emirates From £625*
QATAR AIRWAYS From £400*
ETIHAD AIRWAYS From £404*
KUWAIT AIRWAYS From £330*

For more information and reservation please call Anuradha, Sadeesh or Ned on

020 8748 3535

Duke's Court Travel

*Subject to conditions

204 KING STREET LONDON W6 ORA

We give you more than just a hand

## ආයාචනයක්! request !

## කාරුණික හදැතියන්ගේ සංසදය
### Kind Hearts Organisation

ශ්‍රීලංකාවේ ගම්බද හා දුර බැහැර දුෂ්කර පළාත්වල රෝහල්වලට හා පාසැල්වලට ඉතා අවශ්‍යව පවතින වෛද්‍ය උපකරණ හා රෝගීන් සඳහා අවශ්‍ය භාණ්ඩද, පාසැල් අධ්‍යාපනික උපකරණ ද ආදී භාණ්ඩ තොගයක් නැව්ගත කිරීමට එක්සත් රාජධානියේ **කාරුණික හදැතියන්ගේ සංසදය** මගින් කටයුතු කරගෙන යනු ලැබේ. එවැනි භාණ්ඩ සපයා දිය හැකි දේශ හිතෛෂීන් සිටිනවා නම් කරුණාකර අපට මේ මස තුළ වහා දන්වන්න.

එංගලන්තය තුළ රෝහල් වලින් ඉවත්කරන, ප්‍රයෝජනයට ගත හැකි හොඳ තත්වයේ රෝහල් උපකරණද, පාසැල්, විශ්ව විද්‍යාල හෝ කාර්‍යාලයන්හි ඉවත් කරන කම්පියුටර් යන්ත්‍ර ආදිය ද විශේෂයි. දුරකථනය මගින් හෝ ඊමේල් පණිවුඩයක් මගින් ප්‍රතිචාරය දක්වන්න. මෙය අප මව්බිම වෙනුවෙන් කරනා සත් කාර්‍යයකි. ඔබට බොහෝ ස්තුතියි!

**Mahesh - 07960443915**
**kumudinikula@yahoo.com**



අපගේ හිතවත් ගණුදෙනුකාර භවතුන් සැමට සාමය සතුට පිරී, සුබ නව වසරක් වේවා!



MCG FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

COMMERCIAL BANK BOC BANK OF CEYLON HNB සම්පත් බැංකුව SampathBank HSBC NSB NDB bank PEOPLE'S BANK

020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි